www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව විපක්ෂයට එරෙහි මර්දනය දියත් කරයි

## Sri Lankan government cracks down on opposition

සරත් කුමාර විසිනි

2010 ජනවාරි 30

**26** දින පැවති මැතිවරනය ජයග්‍රහන කිරීමෙන් අනතුරුව ජනාධිපති මහින්ද රාජපක්ෂ තම දෙවන නිල කාලය ආරම්භ කලේ, දේශපාලන ප්‍රතිවාදීන්ට එරෙහිව පුලුල් මර්දනයක් දියත් කරමිනි. සැලකිය යුතු වැඩි ඡන්දයකින් ජයග්‍රහනය කලේ වී නමුත් පාලක පන්තිය ඇතුලත තියුනු බෙදීම්, පැතිරුන ජනතා අප්‍රසාදය සහ කඩා වැටෙන ජීවන කොන්දේසි පිලිබඳ අතෘප්තිය මධ්‍යයේ රාජපක්ෂගේ පදනම තවමත් බෙලහීනය.

යාපනය අර්ධද්වීපය ආසන්නයේ පිහිටි කයිට්ස් දූපතේදී, විපක්ෂයේ අපේක්ෂක ජෙනරාල් ෆොන්සේකාට හෝ සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂක විජේ ඩයස්ට ඡන්දය ප්‍රකාශ කලේ යැයි ඊපීඩීපී සංවිධානයේ සැකයට බඳුන්වූ ජනතාව බියගැන්වීමේ අරමුනින් 28 දින ඔවුන් මැරවරයන් මෙහෙයවීය. දුසිම් ගනනක් මිනිසුන්ට කායිකව පහර දෙන ලදි. සසප ආධාරකරුවෙකු රෝහල් ගත කොට තිබෙන අතර ඔහුගේ සෞඛ්‍ය තත්වය පිලිබඳව දැන ගැනීමට නොහැකිවී තිබේ. යාපනය ප්‍රදේශයේ දාමරික ක්‍රියා පිලිබඳව කුප්‍රකට ඊපීඩීපීය රාජපක්ෂගේ පාලක සන්ධානයේ කොටස් කරුවෙකි.

කයිට්ස්වල පහරදීම් රටපුරා පැතිරී ගිය රටාවකට අනුව සිදු විය. ඊයේ සවස, හමුදාව හැරගියවුන් සහ නීති විරෝධී ගිනි අවි සෙවීමේ ව්‍යාජයෙන් විපක්ෂ අපේක්ෂක ෆොන්සේකාගේ කොලඹ පිහිටි මැතිවරන කාර්යාලයට විශේෂ කාර්ය බලකායේ 150ක පමන පොලිස් කොමාන්ඩෝ භටයින් පිරිසක් කඩා වැදුනි.

පැය හයක් පුරා සිදුවූ මෙහෙයුම නිමා වූයේ නිලධාරීන් හය දෙනෙකු ඇතුලු විශ්‍රාමික හමුදා නිලධාරීන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ රැඳවුම් භාරයට ගැනීමෙනි. පරිඝනක දෘඩාංග, ජංගම දුරකථන සහ ඇතැම් ලියවිලි අත් අඩංගුවට ගැනුනි...

සෝදිසි මෙහෙයුමේදී ආයුධ හෝ පුපුරන ද්‍රව්‍ය හමු නොවූ බව එක්සත් ජාතික පක්ෂයේ (යූඇන්පී) නියෝජ්‍ය නායක, කරු ජයසූරිය වාර්තා කරුවන් වෙත ප්‍රකාශ කලේය. "ඔවුන් [රැඳවුම් භාරයට ගැනුනු අය] සියලු දෙනා සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරින් සහ භටයින් බව අප ඒ අයට දැන්වුවා," යයි හෙතෙම ප්‍රකාශ කලේය.

ජාතික ආරක්ෂාව පිලිබඳ මාධ්‍ය මධ්‍යස්ථනයේ විධායක අධ්‍යක්ෂ, ලක්ෂ්මන් හුලුගල්ල 26 දින ප්‍රකාශ කලේ, ආරක්ෂක ලේකම් හා ජනාධිපතිගේ සොයුරු ගෝඨාභය රාජපක්ෂ ඇතුලු ජනාධිපතිගේ පවුලේ සාමාජිකයන් ඝාතනය කිරීමට ෆොන්සේකා විසින් සංවිධානය කරන ලද කුමන්ත්‍රනයක් ආරක්ෂක හමුදාවන් විසින් අනාවරනය කරගත් බවයි.

"සුඛෝපභෝගී හෝටල් දෙකක කාමර 70ක්" කුලියට ගෙන තිබූ අතර "ජනාධිපති සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් මරා දැමීම සඳහා විශ්‍රාමික හමුදා නිලධාරීන් හා හමුදාව හැරගියවුන්" ෆොන්සේකා විසින් යොදවාගෙන තිබූනේ යැයි හුලුගල්ල පැවසීය. ඔහු තම අරුම පුදුම ප්‍රකාශ වලට පිටුබලය සපයන සාක්ෂි ඉදිරිපත් නොකලේය, එහෙත් කුමන්ත්‍රන තැතේදී ෆොන්සේකාගේ සහභාගිත්වය සනාථ වුව හොත් ඔහු අත් අඩංගුවට ගනු ඇති බව නිවේදනය කලේය.

ෆොන්සේකා සහ ඔහුගේ ආධාරකරුවන් නවාතැන් ගෙන සිටි සිනමන් ලේක් සයිඩ් හෝටලය 26 දින සවස සිය ගනනක් ආයුධ සන්නද්ධ හමුදා භටයන් විසින් වටලන ලදි. භට කන්ඩායම් හමුදාව හැර ගිය වුන් ඇල්ලීමේ මෙහෙයුමක නිරතව සිටින්නේය යන ආන්ඩුවේ ප්‍රකාශත් සමග උද්වේගකාරී තත්වය පසු දිනය දක්වා ද දිග් ගැස්සුනි. කිසිවක් හමු නොවුනු

අතර රාජපක්ෂ තමා අත් අඩංගුවට ගැනීමට අර අඳින්නේයැයි ෆොන්සේකා චෝදනා කලේය.

හුලුගල්ලේගේ ප්‍රකාශයෙන් අනතුරුව ෆොන්සේකා, කුමන්ත්‍රන චෝදනාව දැඩි ලෙස ප්‍රතික්ෂේප කලේය. "එහෙනම් මේක නේවාසික නිලධාරීන්ගේ කුමන්ත්‍රනයක් වෙන්න තිබුනා. ආන්ඩුව හිතන්නේ ජනාධිපතිගේ කාර්යාලයට යාබද හෝටලක ඉඳලා කුමන්ත්‍රනයක් කරන්න තරම් මම මෝඩයෙක් කියලා," ඔහු මාධ්‍යයට පැවසීය. රාජපක්ෂට වඩා සියයට 18 කටත් අඩුවෙන් ඡන්ද ලබා ඇති මුත් ජයග්‍රාහකයා තමන් බවත් ප්‍රතිඵල අභියෝගයට ලක් කිරීමට තමා සැලසුම් කරන බවත් ජෙනරාල් පුන පුනා ප්‍රකාශ කරයි.

"අපි මැතිවරන කොමසාරිස්ට ලියුමක් යවලා තියෙනවා. ඒ වගේම මෙම ප්‍රතිඵලවල නීත්‍යානුකූල භාවය අභියෝගට ලක් කරන්න මූලික අධිකරන ක්‍රියා පටිපාටින් ආරම්භ කරලා තියෙනවා," ෆොන්සේකා සඳහන් කලේය. "මම ඔහුට වඩා මිලියන 1.4කින් ඉදිරියෙන් ඉන්නවා කියලා ආරම්භක අදියරවලදී ම විශ්වාසවන්ත ආරංචි මාර්ගවලින් මට දැන ගැනීමට ලැබුනා. මෙම ඡන්ද ප්‍රමානය ජනාධිපතිට හරවලා යවලා."

සිය ආරක්ෂක ජාලය ඉවත් කිරීමෙන් ආන්ඩුව, තම පෞද්ගලික ආරක්ෂාව අනතුරේ හෙලා තිබීම පිලිබඳව ෆොන්සේකා ආන්ඩුවට චෝදනා එල්ල කලේය. "ඔවුන් මට ශේෂ කරලා තියෙන්නේ පොලිස් නිලධාරීන් හතර දෙනෙක් විතරයි, නිරායුධ සිවිල්වැසියන්ගේ සහය ලබා ගැනීමටයි මට සිද්ධ වෙලා තියෙන්නේ. හැත්තෑ දෙනෙකුගෙන් සමන්විත මගේ ආරක්ෂක බල ඇනිය කිසිදු විටෙක පහත නොදමන ලෙස ශ්‍රේෂ්ඨාධිකරනය තීන්දුවක් දීලා තියෙනවා, ඒත් ජනාධිපති මේ රටේ නීතියට ගරු කරන්නේ නෑ."

26 දින ආරක්ෂක ලේකම් තවත් නීතිමය තර්ජනයක් ගෙන එමින් බීබීසිය වෙත කියා සිටියේ, එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ නායකයින් ඝාතනය කිරීමට ආරක්ෂක ලේකම් විසින් අන දුන්නේය යැයි මැතිවරන ව්‍යාපාරය අතර කාලයේ ෆොන්සේකා නැගූ චෝදනාවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ආන්ඩුව බලාපොරොත්තු වන බවයි. පුවත්පත තම ප්‍රකාශය සාවද්‍ය ලෙස උපුටා දක්වා ඇතැයි කියමින් ෆොන්සේකා පසුව තම චෝදනාව හකුලා ගත් නමුත්, පසුගිය මැයි මාසයේ යුද්ධයේ අවසන් දිනවලදී සිදු කෙරුනු එකී ඝාතන පිලිබඳව ජාත්‍යන්තර මාධ්‍යය විසින් කරුනු හෙලිදරව් කර තිබීන. "අපි නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා. අදාල නීති ඔහු විසින් උල්ලංඝන කර තිබේනම් අප ක්‍රියාත්මක වෙනවා,"යැයි කියමින් රාජපක්ෂ ෆොන්සේකාගේ ප්‍රතිචාරය අවඥාවට ලක් කලේය.

යුද අපරාධ චෝදනා කෙරෙහි ආන්ඩුව විශේෂයෙන් ම සැලකිලිමත්ව සිටියි. එල්ටීටීඊ පරාජය ආසන්නව තිබියදී, කොලඹ තුල වර්ධනය වූ චීනයේ අධිකාරයට හරස් කැපීමටත්, රාජපක්ෂ පාලනයට බලපෑම් දැමීමටත්, එක්සත් ජනපදය සහ එහි යුරෝපීය සගයන් මෙම කාරනය යොදා ගැනීමට මං සෙවූහ. යථාර්තය නම්, රාජපක්ෂ මෙන්ම මැතිවරනයට තරග කිරීම සඳහා දෙසැම්බර් මාසයේ නිලයෙන් ඉල්ලා අස්වෙන තෙක් ම රටේ ප්‍රධාන හමුදා නායකයාව සිටි ෆොන්සේකා යන දෙදෙනාම යුද අපරාධවලට සහ ක්‍රමානුකූලව මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් උල්ලංඝනය කිරීමට වගකිව යුතුය යන්නයි.

ෆොන්සේකාට එරෙහි අන්ඩුවේ තර්ජනය, මාධ්‍ය ද ඉලක්ක කරගත් පුලුල් වැඩපිලිවෙලක කොටසකි. මාධ්‍යවේදීන් බියගැන්වීමේ ක්‍රියා නතර කරන ලෙස දේශ සීමාවලින් තොර වාර්තාකරුවෝ නමැති ජාත්‍යන්තර මාධ්‍ය නිරීක්ෂකයෝ ඊයේ රාජපක්ෂගෙන් ඉල්ලා සිටියහ. "මෙම පශ්චාත් මැතිවරන ප්‍රචන්ඩත්වයේ රැල්ල ජනාධිපති රාජපක්ෂගේ දෙවන ධූර කාලයේ ආරම්භය මත නොමැකෙන පැල්ලමක් ඇති කල හැකිවාක් මෙන් ම එලඹෙන වසරවල දේශපාලන තත්වය සඳහා නරක පෙරනිමිති ඇඟවුම් කරයි," ප්‍රකාශනය සඳහන් කලේය.

29 දින සවස ලංකා පුවත්පතේ කර්තෘ, චන්දන සිරිමල්වත්ත අපහාසාත්මක ලිපියක් පල කලේය යන චෝදනාවක් මත ජනවාරි 26 දින අත් අඩංගුවට ගත්තේය. මෙම පුවත් පතේ අයිතිකාරයන් වූයේ, යූඇන්පිය සමග එක්ව ෆොන්සේකා ජනාධිපති කිරීමට පිටුබලය සැපයූ විපක්ෂයේ ජනතා විමුක්ති පෙරමුනය. 26 දින ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් තමා මරා දමන බවට හා ලංකා පුවත්පත් කාර්යාලයට ගිනි තබන බවට තර්ජනය කලේ යයි චෝදනා නැඟීය.

අනෙකුත් සිදුවීම් අතර, 28 දා හවස සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරීන් විසින් ලංකාඊනිව්ස් වෙබ් අඩවියේ කාර්යාලයට සීල් තැබීම කැපී පෙනුනි. මීට ඉහතදී රජය සතු ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් එම වෙබ් අඩවිය අවහිර කර තිබිනි. එදිනම ශ්‍රී ලංකා

ගුවන් විදුලි සංස්ථා ප්‍රධානියාගේ බලපෑම මත ආයතනය විසින් රාජපක්ෂට හිතැති ඒකපාර්ශවීක මැතිවරන ප්‍රචාරනයක යෙදීම පිලිබඳව කල විවේචනයක් හේතුකොටගෙන වාර්තා කරුවෙකු වන රවී අබේවික්‍රමට ආයතනයේ නිලධාරියෙක් විසින් පහර දී තිබුනි.

“මෙතැන් සිට ඉදිරියට හැමදෙනාගේම, ඔවුන් මට ඡන්දය දුන්නත් නැතත් ජනාධිපති මමයි” ජයග්‍රාහී සැමරුම් කතාවකදී රාජපක්ෂ ප්‍රකාශ කලේය. යථාර්තය නම් රාජපක්ෂ, අප්‍රේල් මාසයේ දී එලැඹීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරනයේදී දේශපාලන විරුද්ධත්වය මැඩලීමට රාජ්‍ය මෙවලම මුලුමනින්ම යොදා ගැනීමට පසුබට නොවනු ඇතැයි යන්නය. ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) විසින් ඉල්ලා සිටින සීමා පැනවීමේ විෂකුරු නිර්දේශ ක්‍රියාවට දැමීමට කැස කවමින් සිටියදී මාධ්‍ය විවේචකයන්ට එරෙහිව ගනු ලබන පියවර කම්කරු පන්තිය විසින් තියුනු අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතුය.

සිය මැතිවරන වේදිකාවේදී රාජපක්ෂ, මාස හයක් ඇතුලත ඒක පුද්ගල ආදායම දෙගුනයක් කරනු ඇති බවට පාරම්බෑවේය. මැතිවරන ව්‍යාපරය අතර තුරදී බලශක්ති මධ්‍යස්ථාන, නව වරායන් හා ප්‍රවාහන පද්ධතීන්ගේ ඡායා රූප සහිත යෝධ ප්‍රදර්ශන පුවරු වලින් සමන්විත වේදිකා මත ඔහු නැගී සිටියේය. යථාර්තයේ දී රට මුහුනපා සිටින්නේ, අපනයන වෙලඳපොලේ හැකිලීමකින් ද දැවැන්ත මිලිටරි වියදම්වල ප්‍රතිපලයක් ලෙස විශාල නය කන්දරාවකින් මිරිකෙමින් සිටින ආර්ථික අර්බුදයකට ය.

තියුනු ගෙවුම් ශේෂ අර්බුදයක් මඟහරවා ගැනීමට පසුගිය ජූලි මාසයෙදී ජාමූඅ වෙතින් ඩොලර් බිලියන 2.6ක නයක් ගැනීමට ආන්ඩුවට බල කෙරුනි. 2011 වසර අවසන්වන විට දල දේශීය නිෂ්පාදනයෙන් සියයට 4කට සමාන ප්‍රමානයකින් අයවැය හිඟය කපා හැරීම; බදු ඉහල දැමීම; විදුලි බල මන්ඩලය හා ඛනිජතෙල් සංස්ථාව ඇතුලු ප්‍රමුඛ රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යූහගත කිරීම යනාදිය එම නය ගැනීමේ කොන්දේසි වලට, ඇතුලත් වේ.

“ආර්ථිකය ගොඩ නැගීම” තමාගේ ප්‍රමුඛ කර්තව්‍ය වනු ඇතයි රාජපක්ෂ කියා සිටියේය. ප්‍රායෝගිකව මෙහි අදහස වන්නේ, කම්කරු පන්තිය සහ ගොවි ජනතාවගේ සමාජීය තත්වය මතට එල්ල කෙරෙන රුදුරු ප්‍රහාරයන්ය. එය නියත ලෙසම විරෝධය අවුලුවනු ඇත. පසුගිය මැයි මාසයේ එල්ටීටීඊ පරාජය කර තිබියදීත් නඩු තීන්දුවකින් තොරව අත් අඩංගුවට ගැනීමටත්, වෘත්තීය අරගල වලට එරෙහිව තහනම් නියෝග පැනවීමට මෙන්ම මාධ්‍ය වාරනය සඳහා අවශ්‍ය සකල බලතල ජනාධිපති අතට ගැනීම සඳහා රාජපක්ෂ විසින් හදිසි තත්වය අඛන්ඩව පවත්වා ගනිමින් සිටී.

රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම දැන් ප්‍රශ්නයක් කර නොගත යුතු යයි රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහලේකම් මෛත්‍රීපාල සිරිසේන 28 දින තර්ජනාත්මකව ප්‍රකාශ කලේය. විධායක ජනාධිපති තනතුර අහෝසි කිරීමට පොරොන්දු වෙමින් ෆොන්සේකා, තමා ප්‍රජාතන්ත්‍රවාදියෙකු ලෙස පෙනී සිටීමට උත්සාහ කලේය. කැබිනට් තනතුරු පවරා ගැනීමේ ද අමාත්‍යවරුන් පහකිරීමේ ද ආන්ඩු පෙරලා දැමීමේ ද බලතල විධායක ජනාධිපතිවරයා සතුය.

ආරක්ෂක සහ මූල්‍ය අමාත්‍ය ධූර දෙකම උසුලන රාජපක්ෂ, පාර්ලිමේන්තුව සහ කැබිනට් මන්ඩලය නොතකා හැරීම සඳහා විධායක ජනාධිපති ධූරය යොදා ගත්තේය. ඔහු තම සහෝදරයා වන ගෝඨාභය ද ඇතුලු, ජෙනරාල්වරුන් ද දේශපාලන හිතවතුන්ගෙන් ද සමන්විත නිලධාරි කල්ලියක් හරහා බලය ක්‍රියාත්මක කරයි. තම සිව් වසරක පාලන කාලයේදී රාජපක්ෂ, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පත්වීම් නිරීක්ෂනය කිරීමට ව්‍යවස්ථාදායක කමිටුවක් පිහිටුවිය යුතු යයි නිර්දේශ කර ඇති 17වැනි ව්‍යවස්ථා සංශෝධනය ඇතුලු ශ්‍රේෂ්ඨාධිකරනයේ නියමයන් මෙන්ම ආන්ඩු ක්‍රම ව්‍යවස්ථාව ද උල්ලංඝනය කර ඇත. එල්ටීටීඊයේ පරාජයෙන් අනතුරුව රාජපක්ෂ සමග විරසක වන තෙක්ම ෆොන්සේකා ජනාධිපති කල්ලියේ කොටස්කරුවෙක් විය.

මෛත්‍රිපාල සිරිසේන විධායක ජනපති ධූරය ආරක්ෂා කලේ, පාර්ලිමේන්තුව තුල “සතුරු” උපාමාරුව පරාජය කිරීමට එය සහය වී ඇතයි යනුවෙන් සඳහන් කරමිනි. සිරිසේනගේ ප්‍රකාශ, ජාතිය ගොඩ නැගීමට ගෙනයන්නෙමි යයි රාජපක්ෂ කියා සිටින “ආර්ථික යුද්ධය” තුලදී ඔහු පාර්ලිමේන්තුව, නීති පද්ධතිය හා ව්‍යවස්ථාවට ඉහලින් දිගටම නිර්දය ලෙස ක්‍රියා කරනු ඇති බවට කෙරෙන පැහැදිලි ඇඟවුමකි.

**© www.wsws.org**